ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2019 ජූනි 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 මැයි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

**දුරකථනය:** 011-2147414 **ෆැක්ස්:** 011-2877945 **ඊමේල්:** prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2019 මැයි මාසයේ මතුපිට උද්ධමනය 3.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය අප්‍රේල් මාසයේ මතුපිට උද්ධමනය 3.6%ක් ලෙස වාර්තා විය. 2019 මැයි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 මැයි මාසයේ 2.1% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -0.02%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.1%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 අප්‍රේල් මාසයේ 127.3ක් වූ දර්ශකාංකය 2019 මැයි මාසයේ 128.7 දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 මැයි මාසයේ දර්ශකාංකය 1.4ක වැඩිවීමක් එනම් 1.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.89%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.17%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, අළුත් මාළු, දෙහි, අර්තාපල්, කිරිපිටි, කරවල, රතුළූණු, ලොකුළූණු, සීනි සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පොල්, බිත්තර, පැපොල්, කෙසෙල්, අඹ, පොල්තෙල්, කුකුල් මස් සහ සහල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 මැයි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන' (වාහන මිළදී ගැනීම, ඉන්ධන මිල), 'සෞඛ්‍ය' (වෛද්‍ය/ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම), 'විනෝදාත්මක හා සංස්කෘතික', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'විවිධ භාණ්ඩ හා සේවා', 'රෙදිපිළි හා පාවහන්', 'ආපනශාලා සහ හෝටල්' සහ 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය 2019 අප්‍රේල් මාසය සඳහා වාර්තා වූ පරිදිම 2019 මැයි මාසයේ 6.3%ක් ලෙස වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2018 | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 |
| | අගෝ. | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 |
| | සැප්. | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 |
| | ඔක්. | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 |
| | නොවැ. | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 |
| | දෙසැ. | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 |
| 2019 | ජන. | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 |
| | පෙබ. | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |